## 7. ශීර්ෂය -07 අධිකරණ සේවා කොමිෂන් සභාව

-----------------------------------------------

### 7 1.විගණන විෂය පථය

-----------------------

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය වාර්තා ,සැසඳුම් ප්‍රකාශන පොත් පත් ,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1) 154ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි .සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013දෙසැම්බර් 06 දින කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කරන ලදි . ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ ,අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වි ඇත .එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය ,මට ලැබී ඇති කාර්ය මණ්ඩලය ,අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 7 2.ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150හා 152ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම ,පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ .වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 7 3.විගණන නිරීක්ෂණය

-----------------------

2012 දෙසැම්බර් 31දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) ඉහි සඳහන් පොදු නිරීක්ෂණය සහ 7 4.සහ 7.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** **අයවැය විචලනය**

---------------------

(i) වැය විෂයයන් ක් සඳහා 03සළසා තිබුණු රු 50,150,000.ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) එක් වැය විෂයක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු 10,287,604.ක් වූ අතර එය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට .කි 27

**7.4 . යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**7.4.1 සංයුක්ත සැලැස්ම**

---------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් ,දෙපාර්තමේන්තු ප්‍රධානීන් , දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010මාර්තු 10දිනැති අංක පීඑෆ්/ආර් (4)/5/3/2/2/දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් ,එම සැලැස්ම 2012දෙසැම්බර් 31වන විටත් පිළියෙල කර නොතිබුණි.

**7.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

-----------------------------

ඉහත 7.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010සහ ඉන් ඉදිරියට කොමිෂන් සභාව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් ,සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012දෙසැම්බර් 26දින දීය.

**7.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

-----------------------------

ඉහත 7.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12දිනැති අංක 402හා 2004පෙබරවාරි 20දිනැති අංක (1)402දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ

සභාගත කළ යුතු වුවත් ,සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි .

**7.4.4 අභ්‍යන්තර විගණනය**

-----------------------

කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**7.4.5 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------------

2012වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි .

**7.5 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2012දෙසැම්බර් 31දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 | - |
| (ආ) | තෘතියික මට්ටම | 06 | 03 | 03 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 51 | 34 | 17 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 24 | 17 | 07 | - |
| (ඉ) | වෙනත් )අනියම්( | - | 02 | - | 02 |
| | **එකතුව** | **93** | **67** | **28** | **02** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28ක් පිරවීමට සහ බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.